Department of Wildlife Conservation | No. 811-A, Jayanthipura Road, Battaramulla | Email - dg@dwc.gov.lk | www.dwc.gov.lk

UK International Development
Partnership | Progress | Prosperity

කළමනාකරණය පිළිබඳ සමාලෝචනයක්

මහා රාවණා සහ කුඩා රාවණා අභය භූමිය

දකුණු පළාත, හම්බන්තොට දිස්ත්‍රික්කය

එයින් ආරක්ෂා කෙරෙන්නේ මොනවාද?

මෙම අභය භූමිය, වෙරළින් කි.මී 13 ක් ඔබ්බෙන් පිහිටා ඇති මහා රාවණා සහ කුඩා රාවණා ලෙස හඳුන්වන වැලි ගල් සහ හිරිගල් පර දෙකක් ආරක්ෂා කරයි. මෙම පරයන් කොරල් සහ අළු ගල්පර මෝරා, කැස්බෑවුන්, බලයන් සහ කොරල් පර මත්ස්‍යයන් ඇතුළු සමුද්‍ර ජීවයෙන් සමන්විත වෙයි.
මෙම ප්‍රදේශය 1870 ගණන්වල ඉදි කරන ලද ප්‍රදීපාගාර ද්විත්වය සහ පුරාතනයේ මුහුදුබත් වූ නැව් ඇතුළු ඓතිහාසික ලක්ෂණ නිසා සංස්කෘතිකව ද වැදගත් වෙයි.



රැහැල් රේ

බැක්ටිප් රීෆ් මෝරා

වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත (469 අධිකාරය) යටතේ 2019 ඔක්තෝබර් මස සමුද්‍ර අභය භූමියක් ලෙස නම් කරන ලදී.

විශාලත්වය : වර්ග කි.මී 672.8

Rocks

ආරක්ෂිත ප්‍රදේශයේ කළමනාකරණ ඵලදායිතාව සමාලෝචනය

ආරක්ෂිත ප්‍රදේශයක් නම් කරන විට, එය කෙතරම් හොඳින් කළමනාකරණය වන්නේ ද යන්න අවබෝධ කරගැනීම වැදගත් ය. කළමනාකරණයේ ඵලදායිතාව ඇගයීමට විවිධ ක්‍රම භාවිත කළ හැකි ය. එසේ භාවිත කරන ක්‍රම අතුරින් වඩාත් බහුලව යොදා ගැනෙන්නකි කළමනාකරණ ඵලදායිතා නිරීක්සුම් මෙවලම (METT-4). මෙයට කළමනාකරණ තේමාවන් පහක් වටා පදනම් වුණු ප්‍රශ්න 38කට පිළිතුරු සැපයීම ඇතුළත් වෙයි.

සැලසුම්කරණය

ආරක්ෂිත ප්‍රදේශයට අදාළ නීති සහ සැලසුම්කරණය ඇගයීම

ආදාන

සම්පත් ඇගයීම; කාර්ය මණ්ඩලය, අයවැය, උපකරණ සහ පහසුකම්

ක්‍රියාවලිය

කළමනාකරණය සිදු කරන ආකාරය ඇගයීම

ප්‍රතිදාන

කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම ඇගයීම: නිෂ්පාදන/සේවා සැපයීම

ප්‍රතිඵල

ප්‍රතිඵල සහ ආරක්ෂිත ප්‍රදේශවල අරමුණු කෙතරම් දුරට සාක්ෂාත් කරගනු ලැබුවේද යන්න ඇගයීම

අප සිදු කළ දේ

සමුද්‍රීය රාජ්‍යයන්ගේ හවුල්කාරිත්ව වැඩසටහන (Ocean Country Partnership Programme - OCPP) සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DWC), ලද හැකි සාක්ෂ්‍ය සමාලෝචනය කරමින් සහ අඩවි විශේෂඥයන්ගේ මතය භාවිතා කරමින් 2024 ජනවාරි 22 වෙනි දින මහා රාවණා සහ කුඩා රාවණා අභය භූමිය ඇගයීමට ලක් කරන ලදී. වඩාත් හොඳින් සිදුවන්නේ කුමක් ද යන්නත් කළමනාකරණය වැඩි දියුණු කිරීමට ගත හැකි ප්‍රධාන ක්‍රියාමාර්ග මොනවාද යන්නත් අපි හඳුනාගෙන ඇත්තෙමු.

පාර්ශ්වකරුවන්

සමාලෝචනය හා සම්බන්ධ අංශ:

රජය

කළමනාකරණ සංරචක සඳහා METT ලකුණු ප්‍රමාණය



වාසභූමිය/විශේෂය	තත්ත්වය	ප්‍රවණතාව
කොරල් පරය	නොදනී	නොදනී
වෙරළබඩ පක්ෂීන්	නොදනී	නොදනී

හඳුනාගත් තර්ජන

- නීති විරෝධී මසුන් ඇල්ලීම
- කාලගුණ විපර්යාසය
- සංචාරක කර්මාන්තය
- වෙරළ සංවර්ධනය
- පැහැදිලි පාලන භූමිකාවන් මඳකම
- නැව් මාර්ග/නැව් ගමනාගමනය

මීළඟ පියවර

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DWC), ඉදිරි කාලයේ ප්‍රමුඛතා නිර්ණය කිරීමට ඇගයීමේ ප්‍රතිඵල භාවිත කරනු ඇත.

ප්‍රධාන සාර්ථකත්වයන්

1. වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ ප්‍රතිපාධන ප්‍රකාරව ප්‍රකාශයට පත් කර ඇත.
2. සමුද්‍ර අභය භූමිය සඳහා සාක්ෂාත් කරගත යුතු පුළුල් අරමුණු සකසා ඇත.
3. DWC, ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා නාවික හමුදාව ප්‍රදේශයේ නීති විරෝධී මසුන් ඇල්ලීමට එරෙහිව එක්වී කටයුතු කරයි.
4. සමුද්‍ර අභය භූමියේ සීමාවන් වටා තිරසාර බිම් සහ මුහුදු පරිහරණ සැලසුම්කරණයක් සඳහා සහය ලබා දීමට නීති සම්පාදනය කර ඇත.
5. සමුද්‍ර අභය භූමිය එහි අරමුණු සාක්ෂාත් කරගැනීමට හැකි තරමේ හැකියාවකින් සමන්විත වෙයි.

කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා වන ප්‍රධාන ක්‍රියාමාර්ග

- මීළඟ වසර පහ තුළ ගත යුතු ප්‍රධාන ක්‍රියාමාර්ග ඇතුළත් කරමින් SMART (නිශ්චිත, මැනිය හැකි, සාක්ෂාත් කරගත හැකි, අදාළ සහ කාල සීමාවක් වෙන් කෙරුණු) කළමනාකරණ සැලැස්මක් සංවර්ධනය කිරීම සහ පාර්ශ්වකරු ආදානයන්ට අවස්ථාව සැපයීම.
- දැනුවත් කිරීමේ ලිපි ලේඛන හරහා සහ ජීපීඑස් බණ්ඩාංක ලබා දීමෙන් සමුද්‍ර අභය භූමියේ සීමාවන් පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ අවබෝධය වැඩි දියුණු කිරීම.
- සමුද්‍ර අභය භූමිය කළමනාකරණය සහ අධීක්ෂණය සඳහා සහය ලබා ගැනීමට වෙනත් රජයේ සහ රාජ්‍ය නොවන ආයතන සමඟ හවුල්කාරිත්වයන් ගොඩ නගා ගැනීම.
- අනුකූලතා සහ බලාත්මක ව්‍යායාමයන් සඳහා සහය ලබා ගැනීමට දුරස්ථ තාක්ෂණ විකල්පයන් ගවේෂණය කිරීම.